සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / juk; / Grade: 10 | විෂයය / ghlk; / Subject: ඉතිහාසය | පත්‍රය / tpdhj;jhs; / Paper: I,II |

## ඉතිහාසය I

| | | | |
|---|---|---|---|
| (1) 3 | (11) 2 | (21) 3 | (31) 1 |
| (2) 1 | (12) 4 | (22) 1 | (32) 4 |
| (3) 2 | (13) 1 | (23) 4 | (33) 3 |
| (4) 4 | (14) 3 | (24) 3 | (34) 4 |
| (5) 1 | (15) 2 | (25) 1 | (35) 2 |
| (6) 3 | (16) 2 | (26) 4 | (36) 1 |
| (7) 3 | (17) 4 | (27) 2 | (37) 4 |
| (8) 2 | (18) 3 | (28) 2 | (38) 1 |
| (9) 2 | (19) 2 | (29) 3 | (39) 2 |
| (10) 1 | (20) 4 | (30) 3 | (40) 4 |

## ඉතිහාසය II

(01) (අ) (i), (ii) ලංකා හා ලෝක සිතියම් කොටස්වලට අදාලව සිතියම් ලකුණු කර පසු පිටුවේ අමුණා ඇත.

(ආ) (i) A. ප්ලිනි C. මහසෙන් රජු
B. දුටුගැමුණු රජු D. ස්පිල් බර්ජන්

(ii) (i) ක්ෂුද්‍ර ශිලා මෙවලම්
(ii) ප්‍රාග් ඓතිහාසික යුගය.
(iii) බිම් වීදුරු (තිරුවානා) කහඟ ගල් මින් එකක් ලිවීම.
(iv) සතුන් දඩයම් කිරීම, කැපීමට, තැලීමට, සිරීමට, හැරීමට මින් එකක් ලිවීම.

(iii) (i) ලංකා තිලක විහාරය (ii) පොළොන්නරුව
(iii) ගඩොල් (iv) පළමුවන පරාක්‍රමබාහු රජු.

(02) (i) A. තෙත් කලාපය. B. වියළි කලාපය. C. අර්ධ ශුෂ්ක කලාපය

(ii) පිළිස්සූ මැටි වළං භාවිතය, යකඩ ලෝහ භාවිතය. ස්ථිරවාසීවීම, ක්‍රමවත් සුසාන විධි, කෘෂිකර්මාන්තයට නැඹුරු වීම. මින් දෙකක් ලිවීම.

(iii) • හිස් කබලේ දෙකට බෙදෙන ලෙස සිදුරු විදීම. එක් පැත්තක රතු ගුරුගල් ආලේප කිරීම
උදා:- රාවණා ඇල්ල ලෙන.

- මිනිස් ඇටසැකිලිවල රතු ගුරුගල් ආලේප කිරීම.
  උදා:- පාහියංගල ලෙන.
- නමා වකුටු කර මිනිස් ඇටසැකිලි වළලා තිබීම.
  උදා:- කුරුවිට බටදොඹ ලෙන.

(iv)
- කෘෂිකර්මාන්තය යටතේ බෝග වගාව, සත්ත්ව පාලනය ලෙස ප්‍රධාන අංශ දෙකක් පැවතීම.
- බෝග වගාව - ගොඩ ගොවි තැන (හේන් වගාව) මඩ ගොවිතැන වී වගාව ලෙස සංවිධානය වීම.
- කන්න දෙකක් (යල, මහ) හා අතරමැදි කන්නයක් වගා කිරීම.
- සත්ත්ව පාලනය (ගවයන්, එළුවන්, කුකුළන්, ඇති කිරීම) කරුණු තුනක් විස්තර කිරීම.

(03) (i) හුන්දරීවාපීගාම, කඩහවාපීගාම, විහාරවාපීගාම, සුමනවාපීගාම මින් තුනක් ලිවීම.

(ii) A - කසීකාරගාම

B - ගෝපාල ගාම

C - කේවට්ටගාම

D - මණිකාරගාම

(iii)
- ගෘහපතීන් අතරින් ගමිකයෙකු පත්වීම.
- ගමික වත් පොහොසත්කම් ඇති තැනැත්තෙකු වීම.

කාර්ය භාරයඃ-
- ගමේ පොදු කටයුතු නායකත්වය දීම.
- ගමට අයත් වැඩ නඩත්තු කිරීම.
- ජලය බෙදා හැරීම.
- ගමේ ආරවුල් විසඳීම.
- ගම් අතර සුහදත්වය පවත්වාගෙන යාම.
- බදු එකතු කිරීම.

(iv)
- චෝළ පාලනයෙන් රට මුදා ගැනීම.
- අනාගත ආක්‍රමණ වලක්වා ගැනීමට ඥාති සබඳතා පවත්වා ගැනීම.
- ඉන්දියානු සාගරයේ නැගෙනහිර කොටස සමග සබඳතා පවත්වා ගත හැකි ආකාරයට පරිපාලනය සංවිධානය.
- පොළොන්නරුව පාලන මධ්‍යස්ථානයක් වශයෙන් තෝරාගෙන ගෝකණ්ණතිත්ථ වරාය ආරක්ෂා කිරීම.
- පොළොන්නරුවේ දළදා මාළිගය ඇතුළු වෙහෙර විහාර ගොඩ නැංවීම.
- දළදා වහන්සේ ආරක්ෂා කිරීම.
- පැරණි වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය.

(04) (i) වේළුසුමන, ඵුස්සදේව, ථේරපුත්තාභය, නන්දිමිත්‍ර මින් තුනක් ලිවීම.

(ii)
- අනුරාධපුර නගරය ගොඩ නැගීම.
- දසවෙනි රාජ වර්ෂයේදී ග්‍රාම සීමා සටහන් කිරීම.
- මාමාවරු පරදා රාජ්‍යත්වයට පත්වීම. මින් දෙකක් ලිවීම.

(iii) රජවරුන්ගේ ක්‍රියාකලාපය හා පෙනී සිටීමට උත්සාහ කළ ආකාරය අනුව ගොඩ නැගුණු රාජ්‍යත්ව සංකල්ප විස්තර කිරීම. දේවත්ව, බෝධිසත්ව, පර්වතරාජ චක්‍රවර්තී රාජ්‍යත්ව සංකල්ප උදාහරණ සහිතව විස්තර කිරීම.

(iv) • දෙමළ, ග්‍රීක්, අයෝනියන්, කාම්බෝජ ජාවක ජන කණ්ඩායම් හා වෙළෙන්දන් සමඟ අන්‍යොන්‍ය සහයෝගයෙන් කටයුතු කළ බව.
- දෙමළ භික්ෂූන් වහන්සේලා බුද්ධ ශාසනයේ පැවිදි වී සිටි බව.
- දෙමළ ජාතික පුරුෂයින් සමඟ සිංහල කාන්තාවන් විවාහ වී සිටි බව.
- දෙමළ ජනතාවගේ ශුභ සාධන කටයුතු සොයා බැලීමට දෙමළ අධිකාරවරු පත්කර සිටි බව.
- දළදා මාළිගයේ ආරක්ෂාවට විදේශ ජාතික (කේරළ) හමුදා පත්කළ බව. ආදී කරුණු නිදසුන් දෙකක් සහිතව විස්තර කිරීම.

(05) (i) A - යකඩ කර්මාන්තය.

B - රන් කර්මාන්තය.

C - ඇත්දත් කර්මාන්තය.

(ii) • බුලත් පුවක් මණ්ඩපයක තබා වෙළඳාම් කළ යුතුය.
- පොහොය දිනවල වෙළඳාම් කළ අයගෙන් දඩමුදල් අයකර ගත යුතුය.
- වෙළඳපලට ගෙනෙන බඩු පෙර මගට ගොස් නොගත යුතුය.
- රජය විසින් අනුමත නොකළ තරාදි පඩි කිරුම් මිනුම් සඳහා භාවිතා නොකල යුතුය.
- නිලධාරීන්ට නොපෙන්වා භාණ්ඩ විකුණන අයගෙන් දෙගුණයක් බදු අයකළ යුතුය.

මෙවැනි නීති දෙකක් ලිවීම.

(iii) • පස්වන මහින්ද රජතුමා නොයෙක් පළාත්වල පිහිටුවා තිබූ රෝහල්වලට අවශ්‍ය සියලු දේ ලබාදීම.
- හතරවන කාශ්‍යප රජතුමා උණ රෝගීන් සඳහා උපසග්ග රෝගනාස නමින් රෝහලක් ඉදි කිරීම.
- පළමුවන උපතිස්ස රජතුමා පසවන්තිනාමශාලා නමින් මාතෘ නිවාස ඉදි කිරීම.
- බුද්ධදාස රජතුමා ගම් දහයකට එක් වෛද්‍යවරයෙක් බැගින් පත් කිරීම, වෙද පොත් ලිවීම.
- දුටුගැමුණු රජතුමා රෝහල් දහ අටක් ඉදිකළ බව වංශකථාවේ සඳහන් වීම.
- මිහින්තලේ රෝහල, ආළාහන පිරිවෙන් සංකීර්ණයක් පිහිටි රෝහල පිළිබඳ විස්තර කිරීම.

කරුණු දෙකක් සහිත විස්තරයක් සඳහා ලකුණු දෙන්න.

(iv) • හේන් ගොවිතැන
හේනක් සකස් කිරීමේ සිට හේන්වල වගාකළ බෝග පිළිබඳ විස්තර කිරීම සහ හේන් ආරක්ෂා කිරීම.
- වී වගාව සඳහා ජලය ලබා ගැනීමට වාරිමාර්ග සකස් කිරීම. (වැව් හා ඇළ මාර්ග)
- කන්න අනුව වගා කිරීම.
- සිහිනැටි ආදී වී වගා කිරීම.

(06) (i) A - සංඛ සෙනෙවි.

B - බුවනෙකබාහු ආදිපාද

C - සුභ සෙනෙවි.

(ii) • සතුරු ආක්‍රමණ
- මධ්‍යගත පාලනය බිඳ වැටීම.
- ආරක්ෂාව නැතිවීම.
- වෙළඳාම හා ගමනාගමනය කටයුතු අඩපණ වීම.
- ජනතාව වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම

(iii)
- ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය වීම.
- කෘෂි කටයුතු සඳහා අහස් දිය යොදා ගැනීම.
- ප්‍රධාන වගාව වී - ජලය හිඟ ප්‍රදේශවල හේන් ගොවිතැන.
- අතිරික්තය වෙළඳාම් කිරීම සමග වාණිජ ආර්ථික රටාවකට යොමුවීම.
- විදේශ රටවල් සමග වෙළඳ සබඳතා (ඉන්දියාව, අරාබිය, චීනය, පර්සියාව, ඊජිප්තුව)
- අපනයන බෝග හා අපනයන ද්‍රව්‍ය (පුවක්, ගම්මිරිස්, එනසහල්, සාදික්කා, මුතු මැණික්, ඇතුන්, ඇත්දළ)
- සංවිධානාත්මක අභ්‍යන්තර වෙළඳාමක් පැවතීම.
  මෙවැනි වෙනස් කම් දෙකක් විස්තර කිරීම.

(iv)
- කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජුගේ අනුග්‍රහය.
- රජතුමා මෙන්ම තවත් බොහෝ උගත් පඬිවරු සිටීම හා ඔවුන් බොහෝ කෘති රචනා කිරීම.
- තොටගමුවේ ශ්‍රී රාහුල, කැරගල වනරතන හිමි, ඉරුගල් කුලතිලක පිරිවෙන් හිමි, වෑත්තෑවේ හිමි, වීදාගම මහා මෛත්‍රිය හිමි. ආදී පඬිවරු රචනා කළ කෘතීන් පිළිබඳ විස්තර කිරීම.
  (පැරකුම්බා සිරිත, කාව්‍යශේඛරය, බුදුගුණාලංකාරය, ලෝවැඩ සඟරාව, ගුත්තිල කාව්‍ය, හංස, පරවි, සැළලිහිණි ගිරා ආදී සංදේශ.....)

(07) (i) A - සේනාසම්මත වික්‍රමබාහු රජතුමා.
B - කරලියද්දේ බණ්ඩාර රජතුමා.
C - ශ්‍රී විජය රාජසිංහ රජතුමා.

(ii)
- අතුල් පහරදීම, කසපහරදීම, දඬගැසීම, ඉපලෙන් තැලීම, දඬුකඳේ ගැසීම, හිසකෙස් කැපීම, පිටුවහල් කිරීම, රොඩී රැහැට දැමීම, දියේ ගිල්වා මැරීම, ඇතුන් ලවා පාගා මැරීම, උල තැබීම මින් හතරක් ලිවීම.

(iii)
- රටේ සියලු ඉඩකඩම්වල උරුමකරුවා රජු බවට පිළිගැනීම.
- මහනුවර රාජධානියේ ඉඩම්, අයිතිය හා බුක්තිය පදනම් කරගෙන පැවතීම (ගබඩාගම්, නින්දගම්, විහාරගම්, දේවාලගම්, පරවේණිගම්)
- සමාජ සම්බන්ධතා කුල ක්‍රමය පදනම් වීම හා කුල ක්‍රමය මත ආර්ථික කටයුතු පදනම් වීම.
- අවාහ විවාහ කටයුතු ද කුල ක්‍රමය මත පදනම් වීම.
- දීග විවාහ, බින්න විවාහ, එකගෙයි කෑම යනුවෙන් විවාහ ක්‍රම තුනක් පැවතීම.
- සමාජයේ සියලු කටයුතු අත්තම් ක්‍රමයට සිදුවීම ආදී ලක්ෂණ දෙකක් විස්තර කිරීම.

(iv)
- නීත්‍යානුකූල රාජ්‍ය උරුමයක් නොතිබීම.
- උඩරට රාජධානිය පෘතුගීසි ග්‍රහණයෙන් බේරාගත යුතු වීම.
- උඩරට රාජ්‍ය සීතාවක බලපෑමෙන් බේරාගත යුතු වීම.
- පරිහානියට පත් බුදුසසුන නගා සිටුවිය යුතු වීම.
- මහනුවර රාජධානියේ ආර්ථික කටයුතු දියුණු කළ යුතු වීම. මෙවැනි අභියෝග තුනක් ජයගත් ආකාරය පැහැදිලි කරන්න.

(08) (i) ඩාන්ටේ, පෙට්රාක්, බොකෑෂියෝ

(ii) A - ලියනාඩෝ ඩාවින්චි B - මයිකල් ආන්ජිලෝ
C - ගුටෙන්බර්ග් D - ගැලීලියෝ ගැලිලි

(iii) චිත්‍ර කලාව, ප්‍රතිමා කලාව තුළ ඇතිවූ වෙනස්කම් විස්තර කිරීම.

(iv) <u>දේශපාලන ක්ෂේත්‍රය</u>

- ජාතික රාජ්‍ය බිහිවීම.
- මධ්‍යම පන්තියක් බිහිවීම.
- වෙළඳ කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබීම.

<u>ආර්ථික ක්ෂේත්‍රය</u>

- ස්වයං පෝෂිත ආර්ථික ක්‍රමය පරිහානියට පත්වී වෙළඳාමේ දියුණුව ඇතිවීම.
- යුරෝපා රටවල ජාතික වෙළඳ ප්‍රතිපත්ති, ජාතික බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම.
- වෙළඳ කටයුතු පුළුල් වීම නිසා මුදල් භාවිතය.

(09) (i) ඉතිහාසය, කලාව, නීතිය, ආචාර විද්‍යාව මෙවැනි විෂයන් තුනක් ලිවීම.

(ii) වටකුරු ආරුක්කු, උස්කුළුණු, අර්ධගෝලාකාර ශිඛර මින් දෙකක් ලිවීම.

(iii) විශ්වය පිළිබඳ නව මත ඉදිරිපත් වීම.

(නිකලස් කොපර්නිකස්, ජොහැන්ස් කෙප්ලර්, ගැලිලියෝ ගැලිලි)

- ගැලිලියෝ ගැලිලි දුර දක්නය නිපදවීම.
- ජොහැන්ස් ගුටෙන්බර්ග් මුද්‍රණ යන්ත්‍රය නිපදවීම.
- වෛද්‍ය විද්‍යාවේ ඇතිවූ දියුණුව විලියම් හාවේ, පැරසල්සස්, මයිකල් සර්වේස් ගේ නව සොයා ගැනීම් විස්තර කිරීම.
- අයිසෙක් නිව්ටන් ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම.


(iv) * ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ ඇතිවූ වෙනස්කම්


- පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය.
- නව නිලධාරි පන්තියක් හා පරිපාලන ආයතන පද්ධති බිහිවීම.
- රෝම ලන්දේසි නීතිය මෙරටට ලැබීම
- අධිකරණ පද්ධතියක් ලැබීම.

* ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ ඇතිවූ වෙනස්කම්

- වෙළඳ බෝග වගා කිරීම (කෝපි, කොකෝවා, සිංකෝනා, තේ, රබර්)
- වාණිජ ආර්ථික රටාවක් බිහිවීම.
- ආනයන අපනයන ආර්ථික රටාවක් මෙරටේ ඇති වීම.
- දුම්රිය මාර්ග, මහාමාර්ග, වරායන්, වෙළඳ නගර බිහිවීම මෙවැනි වෙනස්කම් ක්ෂේත්‍ර දෙකක් ඇසුරින් විස්තර කළ යුතුය.

I) අ. (I)




N
යුරෝපය
ஐரோப்பா
Europe
වතිකානුව
කළු මුහුද
ග්‍රීසිය
බුරුමය
ගෝව
අප්‍රිකාව
ஆபிரிக்கா
Africa
ඉන්දියන් සාගරය
இந்து சமுத்திரம்
Indian Ocean
බතාවිය